**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**පුරප්පාඩු**

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2022.04.30 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

**වෛද්‍ය මධ්‍යස්ථානය**

**දන්ත වෛද්‍ය නිලධාරි**

අයදුම්කරු පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් දන්ත ශෛල්‍ය වෛද්‍ය උපාධිය සමග දන්ත වෛද්‍ය වෘත්තියෙකු වශයෙන් වසර 04ට නොඅඩු සේවා කාලයක් සපුරා තිබිය යුතු වේ.

**වෛද්‍ය නිලධාරි**

අයදුම්කරු පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් එම්.බී.බී.එස්. උපාධිය සමග වෛද්‍ය වෘත්තියෙකු වශයෙන් වසර 03ට නොඅඩු සේවා කාලයක් සපුරා තිබිය යුතු වේ.

**වැටුප් පරිමාණය :**

**දන්ත වෛද්‍ය නිලධාරි** / **වෛද්‍ය නිලධාරි**
රු. 55,350 – 10x1335:10x1630-85,000 p.m

**සප්ත වාර්ෂික නිවාඩු:**

දන්ත වෛද්‍ය නිලධාරි/ වෛද්‍ය නිලධාරි තනතුරෙහි වසර හතක සේවා කාලයෙන් පසුව එක් අවුරුදු වැටුප් සහිත හෝ අවුරුදු දෙකක වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු සඳහා සුදුසුකම් ලබනු ඇත. මෙම සප්ත වාර්ෂික නිවාඩුව එතෙර ගත කරන විට ඒ සඳහා යාන පත්‍ර ගාස්තු ලැබීමේ හිමිකම අයදුම්කරුට මෙන්ම කලත්‍රයාට ද හිමිවේ.

**ප්‍රතිලාභ:**

මාසික වැටුපෙන් 10% ක් අර්ථසාධක අරමුදලට බැර වන අතර, විශ්වවිද්‍යාලය විසින් බැර කරනු ලබන 15% ක මුදලින් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. තව ද මාසික වැටුපෙන් 3% කට සමාන මුදලක් සේවා නියුක්ති භාරකාර අරමුදලට විශ්වවිද්‍යාලය විසින් බැර කරනු ලැබේ.

**අයදුම් කරන පිළිවෙල -**

මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී/ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ **https://www.kln.ac.lk/vacancies** විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ ලියාපදිංචි තැපෑලෙන් ඒවීමට හැකි වන පරිදි මුද්දර ඇලවූ සෙ.මී 23 x 10 ප්‍රමාණයේ ලිපි කවරයක් එවිය යුතුය. අයදුම්කරුවන් විසින් අයදුම්පත සමඟ අදාළ සහතිකවල පිටපත් අමුණා 2022.04.30 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
**රාජ්‍ය දේපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, හෝ අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුවේ.**

**ලේඛකාධිකාරී**
කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය
2022.04.04